**28-08-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබගේ හඬ දැන් ඇසී ඇත. ඔබ වඩාත්ම උසස් මනුෂ්‍යයින් බවට පත් වන, මෙම බොහෝ සේ ශ්‍රේෂ්ඨ සංගම යුගය, එම දිනය, අවසානයේදී උදා වී තිබේ.

**ප්‍රශ්නය:** ජය සහ පරාජය සමඟ සම්බන්ධයක් ඇති, කුමන දූෂිත ක්‍රියාව, ඔබව දුකට හෙලයිද?

**පිළිතුර:** සූදුව. බොහෝ මිනිසුන්ට සූදු කෙළීමේ පුරුද්ද තිබේ. මෙම ක්‍රියාවලිය දූෂිතයි, මන්ද කෙනෙක් පරදින විට දුක ඇති වන අතර ඔහු දිනන විට, සතුට ඇතිවෙයි. පියා ඔය දරුවන්ට අණ කර තිබේ : දරුවනි, දිව්‍යමය ක්‍රියා සිදුකරන්න. ඔබගේ කාලය අපතේ යන ක්‍රියා, සිදු නොකරන්න. අනන්ත ජය ලබන්නට නිරතුරුවම උත්සාහ දරන්න.

**ගීතය:** අප බලා සිටි දවස, අවසානයේදී පැමිණ ඇත...

ඕම් ශාන්ති. දෙගුණයක් ඕම් ශාන්ති. ඔය දරුවන් 'ඕම් ශාන්ති' කිව යුතු අතර මෙහිදී එය 'දෙගුණයක් ඕම් ශාන්ති' වෙයි. බාබා ලෙසින් අමතන පරම පියා එසේ කියන අතර, ඔය දරුවන්ද එය කියයි. ජීව වන අප, ශාන්තියේ ස්වරූපයන්ය. අප, සාම දේශයේ වැසියන්ය. අප මෙම භෞතික ලෝකයට පැමිණ ඇත්තේ අපගේ චරිත කොටස් රඟ පෑමටයි. ජීවාත්මයන්ට මෙම දේවල් අමතකව ගොසින්ය. ඔබගේ හඬ ඇසුණු දිනය, අනිවාර්යෙන්ම අවසානයේ පැමිණ ඇත. ඇසුණේ කුමක්ද? ඔබ කියන්නේ බාබා, අපගේ දුක නැති කර අපට සතුට ලබා දෙන්න! සියලුම මනුෂ්‍යයින් සාමයට සහ සතුටට කැමතියි. පියා, දුප්පතුන්ගේ ස්වාමියාය. මෙකල, භාරතය සම්පූර්ණයෙන්ම දුප්පත්ය. ඔය දරුවන් බොහෝ ධනවත්ව සිටි බව ඔබ දන්නවා. මෙය දන්නේ ඔය බ්‍රහ්මණ දරුවන් පමණයි. අන් සැවොම සිටින්නේ කැලෑවේය. ඔබ දරන උත්සාහයට අනුව, අංක පිළිවෙලට, ඔය දරුවන්ට විශ්වාසය තිබේ. එම කෙනා ශ්‍රී ශ්‍රී වන බවත් ඔහුගේ උපදෙස් උසස්ම ඒවා බවත් ඔබ දන්නවා. මේවා දෙවියන්ගේ වදන්ය. මිනිසුන් 'රාමා, රාමා' යන නම, හාමෝනියමක් වාදනය කරන ආකාරයෙන් ජප කරයි. කෙසේවෙතත්, රාමා යනු, රිදී යුගයේ රජ තුමාය. ඔහුව බොහෝ වර්ණනා කරනු ලැබුවා. ඔහුට තිබුණේ කලා 14 ක් පමණයි කලා දෙකක් අඩුවෙන්. ඔහු ගැන මෙසේද ගයනු ලබයි රාම රජු කෙසේ වීද, ඔහුගේ වැසියන්ද එසේම විය. ධනවත් වන්නේ ඔබලාය. ලක්ෂ්මී සහ නාරායන්, රාමාට වඩා ධනවත් වන්නේය. රාම රජු මෙන්ම රාමගේ පුරවැසියන්ද විය ... රජෙකුට පිරිනමන්නෙක් යැයි කියයි. ඔහුට ආහාර පිරිනමන්නා (ලබා දෙන්නා) යැයි කියයි. පියාද පිරිනමන්නාය ඔහු ඔබට සෑම දෙයක්ම ලබා දෙයි. ඔහු ඔය දරුවන්ව ලෝකයේ අධිපතියන් බවට පත් කරවයි. එහි ඔබට පාපයක් සිදුකිරීමට, කිසිම අඩුවක් නැත. එහි පාපය පිළිබඳ සඳහනක් නැත. චක්‍රයෙන් භාගයක් එය දිව්‍යමය රාජධානිය වන අතර, ඉතිරි භාගයේදී, එය රකුසු රාජධානිය වෙයි. රකුසන් යනු ශරීර අවධානය සහ අවගුණ පහ ඇති අයයි. ඔබ දැන් තොටියා සහ උද්‍යානයේ අධිපති වෙතට පැමිණ ඇත. ඔබ ඔහු ඉදිරියේ සෘජුවම අසුන්ගෙන සිටින බව ඔබ දන්නවා. ඔය දරුවන්ට මෙතැන අසුන් ගෙන සිටින විට පවා මෙය අමතක වෙයි. ඔබ දෙවියන් පවසන දේට ඇහුම්කන් දිය යුතුයි. පළමුවෙන්ම, ඔබව වඩාත්ම උසස් ජීව බවට පත් කරවීමට ඔහු ශ්‍රීමත් ලබා දෙයි. එබැවින් ඔබ ඔහුගේ උපදෙස් පිළිපැදිය යුතුයි. ඔහු ලබා දෙන පළමුවන සහ ප්‍රධානතම උපදෙස වන්නේ ජීව අවධානයට පත් වන්න. බාබා, ජීව වන අපට උගන්වනවා. මෙය බොහෝ ස්ථිරව සිහියේ තබා ගන්න. ඔබට මෙම වදන් මතක නම්, ඔබගේ ඔරුවට එතෙරට යාමට හැකි වෙයි. උපත් 84 ක් ගන්නේ, එමෙන්ම තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් වන්නේ ඔබ පමණක් බව ඔය දරුවන්ට පහදා දී තිබේ. ලෝකය අපවිත්‍ර මෙන්ම දුකෙන් ඇත. දිව්‍ය ලෝකයට සතුටු දේශය යැයි කියයි. ශිව බාබා, දෙවියන්, අපට උගන්වන බව, ඔය දරුවන් දන්නවා. අප ඔහුගේ ශිෂ්‍යයන්ය. ඔහු පියා මෙන්ම ගුරුවරයාද වෙයි. එබැවින් ඔබ හොඳින් ඉගෙන ගත යුතුයි. දිව්‍යමය ක්‍රියාවන්ද අවශ්‍යයි. කිසිම දූෂිත ක්‍රියාවක් සිදු නොකරන්න. සූදු කෙළීම දූෂිත ක්‍රියාවකි. එයද දුක ගෙනදෙයි. කෙනෙක් පරදින විට, ඔහු දුක් අත්විඳින අතර, ඔහු දිනන විට සතුටට පත්වෙයි. ඔය දරුවන් දැන් මායා අතින් සම්පූර්ණයෙන් පරාජයට පත්ව සිටියි. මෙය ජය සහ පරාජයේ අසීමිත නාටකයයි. රාවණ, අවගුණ පහ වෙතින් ඔබ සම්පූර්ණයෙන්ම පරාජය ලබා ඇති අතර, ඔබ දැන් ඒවා ජය ගත යුතුයි. මායා ඔබව පරාජය කෙරුවා. ඔය දරුවන් දැන් ඇයව පරාජය කිරීමට ඉතා ආසන්නයි. ඔබ දැන් සූදු කෙළිම ආදිය නතර කළ යුතුයි. ඔබ දැන් අනන්ත ජය ලබා ගැනීමට අවධානය යොමු කළ යුතුයි. එවන් කිසිදු ක්‍රියාවක් සිදු නොකරන්න. ඔබගේ කාලය අපතේ නොහරින්න. අනන්ත ජය ලබාගැනීමට උත්සාහ දරන්න. ඔබට මෙසේ

කිරීමට දිරිගන්වන කෙනා, බලවත් පියාය. ඔහු සර්ව බලධාරියාය. සර්ව බලධාරි වන්නේ පියා පමණක් නොවන බව විස්තර කර තිබේ. රාවණද සර්ව බලධාරියෙකි. චක්‍රයෙන් භාගයක් එය රාමාගේ රාජධානිය වන අතර, අනෙක් භාගය එය රාවණගේ රාජධානියයි. ඔබ දැන් රාවණ පරාජය කරනවා. ඔබ දැන් සීමිත සෑම දෙයක්ම අතහැර, අසීමිත දේහි නියැලී සිටිය යුතුයි. තොටියා පැමිණ ඇත. අවසානයේ එම දවස පැමිණ ඇත, එහෙම නේද? උසස්ම-උසස් දෙවියන්ට ඔබගේ හඬ ඇසී තිබේ. පියා පවසන්නේ දරුවනි, චක්‍රයෙන් භාගයක්ම ඔබ බොහෝ සේ ඉබාගාතේ යමින් සිටියා ඔබ අපවිත්‍ර වී ඇත. පිවිතුරු භාරතය, ශිවාලය විය. ඔබ ශිවාලයේ ජීවත් වූ අතර, ඔබ දැන් සිටින්නේ වෛශ්‍යාලයේ (ගණිකා මඩමේ). ශිවාලයේ ජීවත් වුණු අයව, ඔබ වන්දනා කරයි. මෙහි, අසංඛේය විවිධ ආගම්, බොහෝ සේ කෝලාහල ඇති කරයි. පියා පවසන්නේ මා ඒ සෑම එකක්ම විනාශ කර දමනවා. ඒ හැම එකක්ම විනාශ විය යුතුයි. වෙනත් ආගම් ස්ථාපනය කරන කිසිම කෙනෙක් කිසිම දෙයක් විනාශ කරන්නේ නැත. ඔවුන් ගුරුන්වත් නොවෙයි ඔවුන්ට විමුක්තිය ලබා දිය නොහැක. විමුක්තිය ලැබෙන්නේ දැනුම තුළින් පමණයි. සියල්ලන්ටම විමුක්තිය ලබා දෙන්නා මෙන්ම දැනුමේ මහා සාගරය වන්නේ ඒකායන පියා පමණයි. මෙම වදන් ඉතා ප්‍රවේසමෙන් සටහන් කරගන්න. මෙහි සෑම දේකටම සවන් දෙන අය බොහෝ සිටියි, නමුත් ඔවුන් පිටතට ගිය සැනින්, ඔවුන් සියලු දේ මෙහි දමා යයි. ඔවුන්, මව් කුස නම් වූ සිරමැදිරියේ සිටින දරුවෙක් මා කිසිම පාපයක් කරන්නේ නැහැ, යැයි කියන්නා සේය. නමුත් ඔහු පිටතට පැමිණි වහාම, ඔහු දුන් පොරොන්දු එහි දමා එයි. දරුවා වැඩිමහල් වන විටම, පාපයන් සිදුකිරීමට පටන් ගනී. ඔහු රාගයේ අසිපත භාවිත කරයි. ස්වර්ණමය යුගයේ, මව් කුසද මාලිගාවක් වැනිය. එබැවින්, පියා මෙතැන අසුන් ගෙන විස්තර කරන්නේ අවසානයේදී අප පුන පුනා බලා සිටි දිනය ඇවිත්. කුමන දිනයද? කිසිම කෙනෙක් නොදන්නා, වඩාත්ම ශ්‍රේෂ්ඨ සංගම යුගය. ඔබ වඩාත්ම උසස් මනුෂ්‍යයන් වන බව, ඔය දරුවන්ට හැඟෙයි. එය වඩාත්ම ශ්‍රේෂ්ඨ ධර්මය වූ කල්හි, අප උසස්ම-උසස් ජීවයන්ව සිටියා. අපගේ ක්‍රියාවන් පවා බොහෝ සේ ශ්‍රේෂ්ඨ විය. එහි, රාවණගේ රාජධානිය තිබුණේ නැත. පියා අපට ඉගැන්වීමට පැමිණෙන දිනය, අවසානයේදී පැමිණ තිබේ. ඔහු පාරිශුද්ධකරුවාය. එබැවින් ඔබ එවන් පියෙකුගේ ශ්‍රීමත් අනුගමනය කළ යුතුයි. එය දැන් කලි යුගයේ අවසානයයි. පිවිතුරු වීමට ටික කාලයක් අවශ්‍යයි. විශ්‍රාමික කාලය, අවුරුදු 60 කට පසුව බව කියයි, එමෙන්ම කෙනෙක් අවුරුදු 60 ක් වූ සැනින්, ඔහුට සැරයටියක් අවශ්‍ය වෙයි. අද මිනිසුන් දෙස බලන්න! වයස අවුරුදු 80 ක් වූ විට පවා ඔවුන් පාපයන් අත්නොහරියි! පියා පවසන්නේ මම මෙම කෙනාගේ විශ්‍රාමික අවදියේ ඔහුගේ සිරුර තුළට ඇතුළු වී, ඔහුට පහදා දෙනවා. පිවිතුරු වී එතෙර යන්නේ, ජීවාත්මයනුයි. පියාසර කරන්නේ ජීවාත්මයි. ජීවාත්මයන්ගේ අත්තටු දැන් කපා දමා ඇති හෙයින් ඔවුන්ට පියාසර කළ නොහැක. එම අත්තටු කපා දමා ඇත්තේ රාවණයි ඔවුන් අපවිත්‍ර වී ඇත. කිසිම ජීවයකට ආපසු නිවහනට යාමට නොහැක. පළමුවෙන්ම උත්තරීතර ජීවාත්මය, ආපසු යයි. මෙවැනි කියමනක් තිබේ ශිවාගේ පෙරහැර. ශංකර්ගේ පෙරහැරක් නැත. දරුවන් වන අප සැවොම, පියා පසුපස යයි. බාබා පැමිණ ඇත්තේ අපව ආපසු රැගෙන යාමටයි. ඔහු, අපව අපගේ සිරුරු සමඟ ආපසු රැගෙන යන්නේ නැත. සියලුම ජීවාත්ම අපවිත්‍රයි ඔවුන් පිවිතුරු වන තුරු, ඔවුන්ට ආපසු නිවසට යාමට නොහැක. පාරිශුද්ධත්වය තිබුණු කල, සාමය සහ සමෘද්ධියද තිබුණි. ආදි සනාතන දෙවි දේවතා ධර්මයට අයත් ඔබ පමණයි එහි සිටියේ. දැන් වෙනත් සියලුම ආගම් වලට අයත් අය සිටින බැවින්, දේවතා ධර්මය නොපවතී. මෙයට කල්ප වෘක්ෂය යැයි කියයි. මෙම වෘක්ෂය නුග ගසක් සමඟ සංසන්දනය කෙරෙයි. එම ගසට කඳක් නොමැති නමුත් ගසේ ඉතිරි කොටස තවමත් සෘජුව තිබෙන අයුරින්ම, දේවතා ධර්මයේ පදනම නොමැති නමුත්, ඉතිරි වෘක්ෂය තවමත් පවතිනවා. එය අනිවාර්යෙන්ම පැවතුණු නමුත් එය දැන් අතුරුදහන් වී තිබේ. ඉන්පසුව මෙය නැවතත් ඒ අන්දමින්ම සිදුවෙයි. පියා පවසන්නේ මම නැවත වරක් පැමිණ සිටින්නේ, ඒකායන ධර්මය ස්ථාපිත කර, අන් සියලුම ආගම් විනාශ කරවීමටයි. එසේ නොමැතිව ලෝක චක්‍රය භ්‍රමණය වන්නේ කෙසේද? මෙවැනි කියමනකි ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය නැවත නැවතත් ඒ අන්දමින්ම සිදුවෙයි. එය දැන් පැරණි ලෝකය වන අතර, නව ලෝකය ඒ අන්දමින්ම නැවතත් සිදු විය යුතුයි. මෙම පැරණි ලෝකය පරිවර්ථනය වී, නව ලෝකය ස්ථාපිත වෙයි. පැරණි සහ අළුත් වන්නේ මෙම භාරතයයි. පරිස්ථාන් (සුරඟන දේශය) යමුනා ගංතෙර අසබඩ තිබුණු බව කියැවෙයි. බාබා පවසන්නේ රාග කොත මත අසුන් ගැනීමෙන් ඔබ සොහොන් බිමෙහි වැසියන් බවට පත්ව ඇත. ඔබව දැන් පරිස්ථාන්හි වැසියන් බවට පත් කෙරෙනවා. ශ්‍රී ක්‍රිෂ්ණාට අවලස්සන මෙන්ම ලස්සන කෙනා යැයිද කියයි. ඇයි? කිසිම කෙනෙකුගේ බුද්ධියට මෙය ඇතුළු වන්නේ නැත. 'රාධේ' සහ 'ක්‍රිෂ්ණා' යන ඔවුන්ගේ නම් ඉතා හොඳයි. ඔවුන් නව ලෝකයේ රජ කුමරා සහ කුමරියයි. පියා පවසන්නේ පසුව, රාගයේ කොත මත අසුන් ගැනීමෙන් ලෝකය කලි යුගයක් වී ඇත. මහා සාගරයේ දරුවන්, රාග කොත මත පිළිස්සී ගිය බව සිහිපත් කර ඇත. පියා දැන් ඔබ සැවොම මත, දැනුමේ වර්ෂාව

වස්සනවා. ඉන්පසුව ඔබ සියල්ලම ස්වර්ණමය යුගයට යයි. එය දැන් සංගම යුගයයි. ඔබට දැන් අවිනාශී දැනුමේ මාණික්‍ය, දන් දෙනු ලබනවා, එමගින් ඔබ ධනවත් වෙයි. මේ සෑම මාණික්‍යයක්ම රුපියල් සිය දහස් ගණනක් වටී. ඒ මිනිසුන් විශ්වාස කරන්නේ ග්‍රන්ථ වල වැකි, රුපියල් සිය දහස් ගණනක් වටින බවයි. ඔය දරුවන් මෙම ඉගෙනුම තුළින් කෝටිපතියන් බවට පත්වනවා. මෙය ඔබගේ ආදායම් මාර්ගයයි. ඔබ මෙම දැනුමේ මැණික් ධාරණය කරගන්නා අතර ඔබගේ ඒප්‍රනද පුරවාගන්නවා. එම මිනිසුන් එවිට ශංකර්ට කියන්නේ ඕ මහා දේවයන්, අපගේ ඒප්‍රන පුරවන්න! ඔවුන් බොහෝ දේට ශංකර්ට චෝදනා කර ඇත. බ්‍රහ්ම සහ විෂ්ණු ඔවුන්ගේ චරිත කොටස් මෙහි රඟපායි. විෂ්ණුට උපත් 84 ක් ඇති බව මෙන්ම ලක්ෂ්මී සහ නාරායන්ටද උපත් 84 ක් ඇති බව ඔබ දන්නවා. ඔබ බ්‍රහ්මා ගැනද මෙය කියයි. පියා මෙතැන අසුන්ගෙන, නිවැරදි මෙන්ම වැරදි දේ පහදා දෙන අතර, බ්‍රහ්මා සහ විෂ්ණු රඟපාන්නේ කුමන චරිත කොටස්ද කියාත්, පහදා දෙයි. ඔබ දේවතාවන්ව සිටියා. ඔබ චක්‍රය වටා ගොස් බ්‍රහ්මණයන් වී තිබේ. ඔබ දැන් නැවතත් දේවතාවන් බවට පත් වනවා. මුළු කොටසම රඟ දැක්වෙන්නේ මෙහිය. ඔබ පාරාදීසයේ විනෝදය සහ කෙළි සෙල්ලම් දකියි. පාරාදීසය දැන් මෙහි පවතින්නේ නැත. මීරා නර්තනය කළ මුත්, ඒ සෑම දේකටම දර්ශන යැයි කියයි. ඇයට බොහෝ ගරු කරයි. ඇය ක්‍රිෂ්ණා සමඟ නර්තනය කරන දර්ශනයක් දුටුවා, නමුත් එහි ඇති ඵලය කුමක්ද? ඇය දිව්‍ය ලෝකයට ගියේ නැහැ නේද? විමුක්තිය සහ ජීවන-මුක්තිය ලැබිය හැක්කේ සංගම යුගයෙදි පමණයි. ඔබට දැන් මෙම වඩාත්ම ශුභදායක සංගම යුගය වැටහෙනවා. අප දැන් බාබාගේ මාර්ගයෙන්, මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට පත්වනවා. බහුරූපි පිළිරුව පිළිබඳ දැනුමද ඔබට තිබිය යුතුයි. ඒවායේ පිංතූර ඔවුන් තබා සිටියත් ඔවුන්ට කිසිම දෙයක් වැටහෙන්නේ නැත. 'අකාසූර්, බකාසූර්' (ග්‍රන්ථ වල සඳහන් වී ඇති රකුසන්ගේ නම්) යන නම් අයත් වන්නේ සංගම යුගයටයි. 'බෂ්මසූර්' (තමන්ව පුළුස්සාගෙන මරණයට පත් වූ රකුසා) යන නමද තිබේ. ඔහු රාග කොත මත අසුන් ගැනීමෙන් තමන්ව පුළුස්සාගෙන මරණයට පත්වූවා. පියා පවසන්නේ මා දැන් සියලු දෙනාටම නැවත වරක් දැනුමෙහි කොත මත අසුන් ගැනීමට සලස්වා, ඉන්පසුව ඔවුන්ව ආපසු නිවහනට රැගෙන යනවා. සියලු ජීවාත්ම, සහෝදරයන්ය. ඔවුන් කියන්නේ හින්දූන් සහ චීන්නුන් සහෝදරයන් බවයි හින්දූන් සහ මුස්ලිම්වරුන් සහෝදරයන් බවයි, නමුත් දැන් සහෝදරයන් පවා එකිනෙකා සමඟ සටන් කරගන්නවා. ක්‍රියා සිදුකරන්නේ ජීවාත්මයයි. සිරුර තුළින් සටන් කරන්නේ ජීවාත්මයයි. පාපයන් රැස් කෙරෙන්නේ ජීවාත්මය මගිනි, මේ නිසයි මෙසේ කියන්නේ, 'පාප ආත්මයක්'. පියා මෙතැන අසුන්ගෙන බොහෝ සෙනෙහසින් යුතුව පහදා දෙයි. ශිව බාබා මෙන්ම බ්‍රහ්ම බාබා යන දෙදෙනාටම 'දරුව, දරුව' යැයි කීමට අයිතියක් තිබේ. දාදාගේ මාර්ගයෙන්, පියා පවසන්නේ ඕ දරුවනි, ඔය ජීව මෙහි පැමිණ, ඔබගේ චරිත කොටස් රඟපාන බවත්, පියා සියලු දෙනාව පිවිතුරු කර, ඔහුත් සමඟ ආපසු රැගෙන යාමට අවසානයේ පැමිණෙන බවත් ඔබ දන්නවා. පැමිණ, දැනුම ලබා දෙන්නේ පියා පමණයි. ඔහු මෙහි පැමිණිය යුතුයි. මිනිසුන් ශිවාගේ උපන් දිනයද සමරයි. ශිවාගේ උපතෙන් පසුව, ක්‍රිෂ්ණාගේ උපත සිදුවෙයි. ශ්‍රී ක්‍රිෂ්ණා ඉන්පසුව ශ්‍රී නාරායන් බවට පත්වෙයි. දැන් අවසානයේ, චක්‍රය වටා ගොස්, ඔහු අවලස්සන (අපවිත්‍ර) වී ඇත. පියා නැවත පැමිණ, ඔහුව ලස්සන කරවයි. ඔය බ්‍රහ්මණයින් දැන් දේවතාවන් බවට පත්වනවා. ඉන්පසුව ඔබ ඉනිමග දිගේ පහළට පැමිණෙයි. මෙම උපත් 84 හි ගණනය, වෙනත් කිසිවෙකුගේ බුද්ධිය තුළ නැත. ඔය දරුවන්ට විස්තර කළ හැක්කේ පියාට පමණයි. ඔබ ගීතයේ ඇසුවා අන්තිමේදී බැතිමතුන්ගේ හඬ ඇසුණා. ඔවුන් කන්නලව් කරන්නේ ඕ දෙවියනේ, පැමිණ අපට අපගේ භක්තියේ ඵලය ලබා දෙන්න. භක්තිය ඔබට කිසිම ඵලයක් ලබා දෙන්නේ නැත. ඵල ලබා දෙන්නේ දෙවියන්ය. ඔහු බැතිමතුන්ව දේවතාවන් බවට පත් කරවයි. ඔබ බොහෝ භක්තිය කර තිබේ. ශිවාව පළමුවෙන්ම වන්දනා කළේ ඔබයි. මෙම කරුණු හොඳින් වටහා ගන්නා අය, ඔබගේ වංශයට අයත් බව ඔබට හැඟෙයි. කෙනෙකුගේ බුද්ධියේ එය සනිටුහන් නොවන්නේ නම්, එම කෙනා පසුව පැමිණ ඇති අතර, එතරම් භක්තියේ යෙදී නැති බව, ඔබට වටහා ගත හැක. ඔහු කලින් මෙහි පැමිණෙන්නේද නැත. ගණනය කිරීම මෙයයි. බොහෝ භක්තිය කර ඇති අයට බොහෝ ඵල ලැබෙයි අඩු භක්තිය - අඩු ඵල. දිව්‍ය ලෝකයේ සම්පූර්ණ ඵලය ඔවුන්ට අත්විඳින්නට නොලැබෙයි, මන්ද ඔවුන් ආරම්භයේ සිටම ශිවාව වන්දනා නොකළ බැවින්. ඔබගේ බුද්ධි දැන් ක්‍රියාත්මක වනවා. බාබා විවිධ ක්‍රමවේද ඔබට දිගින් දිගටම විස්තර කර දෙනවා. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. එම එක් මැණිකක් කෝටි ප්‍රමාණයක් වටින, දැනුමේ අවිනාශී මාණික්‍යයන්ගෙන් ඔබගේ ඒප්‍රනය පුරවාගන්න. ඔබගේ බුද්ධියෙන් මෙම දැනුම ධාරණය කරගෙන, ඉන්පසුව එය අන් අයට දානය කරන්න.
2. ශ්‍රී ශ්‍රීගේ ශ්‍රේෂ්ඨ උපදෙස් සම්පූර්ණයෙන් පිළිපදින්න. ජීවාත්මය, සතෝප්‍රධාන් කිරීම සඳහා, ජීවාත්ම අවධානයට පත් වීමට පූර්ණ උත්සාහයක් දරන්න.

**වරදානය:** ඔබ සියලු ජීවාත්මයන් සඳහා පිරිසිදු අභිප්‍රායන් සහ උසස් ප්‍රාර්ථනා ඇති කර, හංස බුද්ධියක් ඇති ශුද්ධ හංසයෙකු බවට පත් වේවා.

හංස බුද්ධියක් තිබීම යනු සියලු ජීවාත්ම සඳහා නිරන්තරයෙන් පිරිසිදු හා උසස් සිතිවිලි ඇති කිරීමයි. පළමුවෙන්ම, සියලු ජීවාත්මයන්ගේ අභිප්‍රායන් හඳුනා ගෙන ඒවා තේරුම් ගන්න. ඔබේ බුද්ධියට කිසිදු ජීවාත්මයක් සඳහා අපිරිසිදු හෝ සාමාන්‍ය අභිප්‍රායන් ඇති කර ගැනීමට ඉඩ නොදෙන්න. නිරන්තරයෙන් පිරිසිදු අභිප්‍රායන් සහ පිරිසිදු ප්‍රාර්ථනා ඇති අය ශුද්ධ හංසයෝ වෙති. ඔවුන් ඕනෑම ජීවාත්මයක අකාරුණික දෙයක් දකින විට හෝ අසන විට, ඔවුන් එම අකාරුණිකත්වය ඔවුන්ගේ කරුණාවන්ත ආකල්පයෙන් පරිවර්තනය කරනු ඇත. සෑම ජීවාත්මයක් සඳහාම ඔවුන්ගේ දැක්ම උසස්, නිර්මල සහ ආදරණීය වනු ඇත.

**පාඨය:** ස්නේහ සාගරය වන පරමාත්ම පියා, ඔබ තුළින් දෘශ්‍යමාන වන තරමට ස්නේහ ගංගාවක් වන්න.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: සහජ යෝගීවරයෙක් වීම සඳහා, පරමාත්ම දෙවියන්ගේ සෙනෙහසේ අත්දැකීම් ලබන්න.**

සමහර භක්තිවන්ත ජීවාත්මයන් පරමාත්ම දෙවියන්ගේ සෙනෙහසේ මුසු වීමට කැමති වන අතර සමහරු ආලෝකයේ මුසු වීමට කැමති වෙති. එවැනි ජීවාත්මයන්ට පරමාත්ම පියාගේ හැඳින්වීම, ප්‍රශංසාව සහ ඔබ ඔහුගෙන් ලබාගන්නා ලැබීම් තත්පරයකින් ලබා දෙන්න. ඉන්පසු, ජීවාත්මයන්ට සෙනහසේ අතරමං වීමේ මනෝ ස්ඵීතිය අත්විඳීමට ඉඩදෙන්න. ඔබ සෙනහසේ අතරමං වී සිටින විට, ඔබට පහසුවෙන් මුසු වීමේ රහස තේරුම් ගත හැකිය.